# 7 ශ්‍රේණිය සිංහල

## 22 ඒකකය

# තොප්පි වෙළෙන්දා



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

පසුගිය සතියේ online පංතිය සඳහා සහභාගී වීමට නොහැකි වුනු සිසුන් සඳහා සහභාගී වූ සිසුන්ගේ උපකරයෙන් ලබා දුන් උපකාරක සටහනකි.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# තොප්පි වෙළෙන්දා

## 22



නාට්‍යය යනු වේදිකාවක් මත කිසියම් පිටපතකට අනුව රඟ දැක්වෙන, අසා සහ බලා රස විඳිය හැකි නිර්මාණයකි. ළමයින් සඳහා ම ළමයින්ට ගැළපෙන තේමාවක් පාදක කර ගෙන ළමයින්ට ගැළපෙන ආකාරයට සැකසුණු නාට්‍ය, ළමා නාට්‍ය ලෙස හැඳින්වේ. මෙම පාඩම සකස් කර ඇත්තේ සෝමලතා සුබසිංහගේ (1936-2015) තොප්පි වෙළෙන්දා නාට්‍යයේ පිටපත ඇසුරෙනි.

### සෝමලතා සුබසිංහගේ වෙනත් නිර්මාණ



1. තොප්පි වෙළෙන්දා (1936-2015)
2. කතන්දර දෙකක් (1979)
3. විකෘති (1992),
4. පුංචි අපට දැන් තේරෙයි (1998)
5. රත්මලී, වලස් පවුල, හිම කුමරිය (2000)

### අවබෝධය

1. තොප්පි වෙළෙන්දා නාට්‍යයේ වෙළෙන්දාගේ චරිත ලක්ෂණ මොනවා ද?
2. මිනිස් චරිත හා සත්ත්ව චරිත නිරූපණයේ දී එහි වෙනස පෙන්වීමට කතුවරිය යොදා ඇති ශිල්ප ක්‍රම මොනවා ද?
3. වඳුරන් තොප්පි වෙළෙන්දාගේ දුටු වෙනස්කම් මොනවා ද?
4. වඳුරන්ගෙන් තොප්පි ආපසු ලබා ගැනීමට වෙළෙන්දා යෙදූ උපාය කුමක් ද?
5. "සතුන් අතුරෙන් මිනිසා නුවණක්කාර සතකු බව මේ නාට්‍යයෙන් අවධාරණය කෙරේ." මේ පිළිබඳ ඔබේ අදහස් ලියන්න.

අවබෝධය

1. තොප්පි වෙළෙන්දා නාට්‍යයේ වෙළෙන්දාගේ චරිත ලක්ෂණ මොනවා ද?
    - ✓ ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්ත අයෙකි.
    - ✓ තම දරුවන් වෙනුවෙන් මහන්සි වී වැඩ කරන කාරුණික පියෙකි.
    - ✓ කරුණාවන්ත වෙළෙන්දෙකි

2. මිනිස් චරිත හා සත්ත්ව චරිත නිරූපණයේ දී එහි වෙනස පෙන්වීමට කතුවරිය යොදා ඇති ශිල්ප ක්‍රම මොනවා ද?
    - ✓ සත්ව චරිත වලට කරනම් ගැසීම වැනි රංග විධාන ලබාදීම.
    - ✓ ඇඳුම් පැළඳුම් භාවිතයේදී එම වෙනස නිරූපණය වන ලෙස භාවිතා කිරීම.
    - ✓ චරිත වලට අනුරූප ගමන් විලාස යොදා ගැනීම.

3. වඳුරන් තොප්පි වෙළෙන්දාගේ දුටු වෙනස්කම් මොනවා ද?
    - ✓ ගහෙන් ගහට පනින්ට බෑ.
    - ✓ කරනම් අල්ලන්නට බෑ.
    - ✓ පොළොවෙ මිසක් යන්නට බෑ.
    - ✓ ගෙවල් නැතුව ඉන්නට බෑ.
    - ✓ වලිග නෑ.
    - ✓ මවිල් අඩුලු.
    - ✓ රෙදි කඩමලු ඔතා ඇත.

4. වඳුරන්ගෙන් තොප්පි ආපසු ලබා ගැනීමට වෙළෙන්දා යෙදූ උපාය කුමක් ද?
    - ✓ වඳුරන් තමාව අනුකරණය කරන බව දැනගෙන තමාගේ හිසේ තිබුණු තොප්පිය ගලවා කූඩයට දැමීම. එවිට වඳුරන් ද තම අත වූ තොප්පි ගෙන කූඩයට දැම්මා.

5. “සතුන් අතුරෙන් මිනිසා නුවණක්කාර සතකු බව මේ නාට්‍යයෙන් අවධාරණය කෙරේ.” මේ පිළිබඳ ඔබේ අදහස් ලියන්න.
    - ✓ වෙළෙන්දාගේ ස්ථානෝචිත ප්‍රඥාව නිසා වඳුරන් පැහැරගත් තොප්පි වැඩි මහන්සියකින් තොරව නැවත ලබා ගැනීමට වෙළෙන්දාට හැකි වූ අතර මේ අනුව වඳුරාට වඩා මිනිසා නුවණක්කාර අයෙකු බව නාට්‍ය අවසානයේ පැහැදිලි වේ.

**ලිඛිත අභ්‍යාස**

1. තොප්පි ගන්නට ආ ළමයාගේ අම්මා, වෙළෙන්දා සමග වූ දෙබස ඔබේ වචනයෙන් ලියන්න.
2. වෙළෙන්දා නිදා ගත් ආකාරය කතුවරිය පවසන්නේ කෙසේ ද?
3. මිනිසා වඳුරාගෙන් වෙනස් වූ හැටි දකින වඳුරන් අතර පැවති දෙබස ලියන්න.
4. නාටෝචිත අවස්ථා දෙකක් නාට්‍යයෙන් උපුටා ලියන්න.

**ලිඛිත අභ්‍යාස**

1. තොප්පි ගන්නට ආ ළමයාගේ අම්මා, වෙළෙන්දා සමග වූ දෙබස ඔබේ වචනයෙන් ලියන්න.

අම්මා - (තොප්පියක් අතට ගෙන පරීක්ෂා කරමින්)
මේ තොප්පි කීය ද ?
මේ තොප්පි ගණන් ද ?

වෙළෙන්දා - නෑ ! නෑ ! රුපියල් සියයයි. හැම එකක් ම එක ම මිල.
හරිම ලාබයි.

අම්මා - අප්පේ ! රුපියල් සියයයක් නම් වැඩියි.
රුපියල් පනහක් නම් කමක් නෑ.

වෙළෙන්දා - රුපියල් පනහක් !
ඒක හරි කතාව. රුපියල් පනහට මේක හදන්නත් බෑ.

අම්මා - එහෙමනම් අපිට තොප්පි එපා.
ඔයාම තියා ගන්න.

වෙළෙන්දා - ඔහොම තමයි දැන් කාලේ...
මිනිස්සුන්ට මුදල් බොහොම හිඟයි.

2. වෙළෙන්දා නිදා ගත් ආකාරය කතුවරිය පවසන්නේ කෙසේ ද?

✓ ඉර එළියෙන් ඇස වසා නිදන්නට
එක තොප්පියකින් මුණ වසා ගෙන
තොප්පි කූඩයක් ළඟින් තියා ගෙන
ඇස පියා ගනී ගස යට වැතිරී ගෙන.

3. මිනිසා වඳුරාගෙන් වෙනස් වූ හැටි දකින වඳුරන් අතර පැවති දෙබස ලියන්න.

1 වැනි වඳුරා - ඇගේ මවිල් හරි පොඩ්ඩයි
රෙදි කඩමලු ඔතා ඇතෙයි
මවිල් නැතත්,
වලිග නැතත්,
හරියට වඳුරෙක් ම වගෙයි !
අමුතු වඳුරු රාල කෙනෙක්

3 වැනි වඳුරා - මං අහල තියෙනව බං,
මේ ලෝකෙට,
වඳුරු කුලේ එන්ට කලින්
හිටිය කියල,
මිනිස්සු කියලා සත්තු !

4 වැනි වඳුරා - උන්ට වලිග තිබුණෙ නැතිලු,
මවිල් තිබුණෙ හරි පොඩ්ඩලු.

1 වැනි වඳුරා - හ්ම් !
මූට පිස්සු
අපට පස්සේ උන් ආවේ
අපියි ඉස්සරින් ම ආවේ. //

5 වැනි වඳුරා - උන්ට කෑම අඩු හින්දා
වලිගෙ නැතිලු
මවිල් අඩුලු

6 වැනි වඳුරා - පරක්කු වී ආ හින්දා
උන්ට නැතිලු වලිග ලැබුණෙ
උන්ට නැතිලු මවිල් ලැබුණෙ

2 වැනි වඳුරා - ඇඳුම් නැතුව සීතලයි ලු.

4. නාටෝචිත අවස්ථා දෙකක් නාට්‍යයෙන් උපුටා ලියන්න.

- ✓ තොප්පි වෙළෙන්දා නිදා සිටි වේලාවේ වඳුරු රැළ කඩා පනින අවස්ථාව.
- ✓ වෙළෙන්දා දෙ ඇස් පිස හැර බලා මවිත වී නැගිට, හිස් කූඩෙ දුටු අවස්ථාව.

## ළමා නාට්‍ය (පිටපත්) රචනය

- ✓ නාට්‍යයක් සඳහා ප්‍රධාන වශයෙන් පිටපතක් (නාට්‍යය පෙළ) තිබිය යුතු ය.
- ✓ එහි රංග විධාන තිබිය යුතු ය.
- ✓ නාට්‍යය නරඹා මෙන්ම නාට්‍යයක පෙළ කියවා ද රස විඳිය හැකි ය.
- ✓ නාට්‍යයෙහි ඇතුළත් වන පද්‍ය කොටස් යෝග්‍ය සංගීත තාල අනුව ගායනා කළ යුතුය.

### ප්‍රායෝගික අභ්‍යාස

1. මේ දෙබස කියවන්න. එවැනි දෙබසක් ලියන්න.

ලබු වැල: වැඩුණු මහ ලොකුවට
කීය ද වයස තමුසෙට

කිතුල් ගස: අහන එක පුදුම ය
දැන් මට වයස පනහ ය

ලබු වැල: මට මාස හයකුත්
දවස් හතරකි තවමත්

කිතුල් ගස: ඔබ බාල බව මම
දැන ගෙන සිටිමි හොඳට ම

ලබු වැල: නැතත් වයසක් මට
උස වෙමි ඔබේ තරමට
මට මෙන් ඉක්මනට
හැදෙන්නට බැරි මොකද තමුසෙට

කිතුල් ගස: ඉක්මනට හැදුණොත්
ඒ ඉක්මනින් නැති වෙත්
මගෙ ඇඟේ වෙළිලා
මාසෙන් දෙකෙන් හැදිලා
ඔබ මෙන් මැලවිලා
දහස් ගණනක් ගියා මැරිලා

-එස්. මහින්ද හිමි-

2. නාට්‍යයේ එන රංග විධාන ගැන සිසුන් සමග සාකච්ඡා කරන්න.
3. මලක් සහ බඹරකු අතර ඇති වන සංවාදයක් ලියන්න.
4. උදෑසන පාසලට පිටත් වන අවස්ථාවේ අයියා, මල්ලී සහ ඔබ අතර සිදු වන සංවාදයක් ලියන්න.
5. පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට සංවිධානය වී ඔබ කැමති පුංචි කතාවක් තෝරා ගෙන නාට්‍ය පිටපතක් ලියන්න. එය රඟ දක්වන්න.

**ප්‍රායෝගික අභ්‍යාස**

Anuhas

1. බාහිර පෙනුමෙන් හොඳ නරක
මනින්න එපා.

(මී පැටියා පළමු ගමනට සූදානම් වී සිටියි.)

පිරිස - මී පැටියා ලෝකය නරඹා එයි.

මී පැටියා - "අම්මේ මම අද අමුතු සත්තු දැක්කා."

(මී පැටියා වුනු දේ විස්තර කරමින්)

මී පැටියා - එක සතෙක් හිටියා
ලොම් ගොඩයි
වලිගයයි.
හරි ලස්සනයි.

තව සතෙක් හිටියා
කරමලයි
බය අද්දකින
හරි භයානකයි.

අර ලස්සන සතා එක්ක
මට කතා කරන්න ද බැරිවුණා.

(මී අම්මා පැහැදිලි කරමින්)

මී අම්මා - පුතේ නුඹ අර දුටු
කරමලයි. ගෙබිදියයි ඇති සතා
හොඳ අහිංසකයි.
කුරුල්ලෙලසියි.
ඌ කුකුළෙකියි

පුතේ නුඹ අර දුටු
ලොම් ගොඩයි. ලස්සන සතා
මීයන් කා දමයි
හරි භයානකයි
ඌ පූසෙකියි.

(මී පැටියා සුසුම් හරියි.)

ආදර්ශය - කිසි කෙනෙකුව බාහිර පෙනුමෙන් මනින්න එපා

③ මල සහ බඹරා

(මල සුළඟට වැනෙයි)

මල - එන්න. එන්න.
එන්න. එන්න.

බඹරා - මම නොයෙකුත් පරාගනය
කරන්නේද මල් යාළුවේ?

මල - එපා. එපා.
ඔයානම් එපා.

බඹරා - ඇයි මල් යාළුවේ?

මල - මම මේ ගිරියේ ලස්සන
සමනලුන් මී මැස්සන්
එනකම්...

ඔයා කැතයි!

බඹරා - හරි එහෙනම් යාළුවේ.

(බඹරා දුක්වී යයි)

පිරිස - ළමයින් කිහිපදෙනෙකු
විය මල කඩයි. ළමයාගේ
අතින් වැටෙයි. ළමයෙක්
නොදැක මල පාගා
දමයි.

බඹරා වෙනත් මලකින්
පරාගණ කරයි.

④ (මල්ලි කාමරයෙන් එළියට එයි.)

මල්ලි - අයියේ ඔයා ලෑස්තිද?

අයියා - මම නම් ලෑහැස්තියි.

(මල්ලි සපත්තු දමයි.)

අයියා - ඉක්මන් කරන්න.
අද ඔයා නැගිටින්න පරක්කුයි.

මල්ලි - හරි. හරි.
තව ටිකයි.

අයියා - 7 යි වෙලාව

(මල්ලි පොත් බෑගය ලෑහැස්ති කරයි.)

මල්ලි - ඉවරයි. යමු.

දෙදෙනාම - අම්මේ, අපි යනවා.

(5)

# පැණි බඳුන

(ගෘහපාලිකාව අතින් පැණි බඳුන වැටේ.)

1 මැස්සා - අර බලන්න.
පැණි බඳුනක්.

2 මැස්සා - ඔව්, ඒකෙන් එන මිහිරි සුවඳ

1 මැස්සා - මැස්සනි,
අපි යමු-අර පැණි කමු.

පිරිස - මැස්සෝ පැණි කයි.

4 මැස්සා - මාර රසයි.

3 මැස්සා - තාවනම් කන්න බැහැ.

මැස්සෝ - ඔව්, ඔව්.

පිරිස - ඔවුන්ගේ බඩ පිරුණත් ඔවුන් එතැණින් ගියේ නැත, පැය ගණනකින් පැණි වියළී ගියේ ය. පාද සහ පිහාටු සෙලවීමට නොහැකි විය. මැස්සෝ සියලු දෙනා මිය ගියහ.

සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | සිංහල භාෂාව හා සාහිත්‍යය | තුන් වන වාරය | 22 තොප්පි වෙළෙන්දා ඇගයීම |

සැකසුම :- යූ.කේ.බී. ප්‍රියදර්ශනී
බ/ප/හො/ වෙනිවැල්පිටිය ක.වි.

1.නාට්‍යයක් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?

2.තොප්පි වෙළෙන්දා නාට්‍යය නිර්මාණය කර ඇත්තේ කවුරුන්ද?

3.සෝමලතා සුබසිංහ මහත්මියගේ වෙනත් ළමා නාට්‍ය නිර්මාණ කිහිපයක් නම් කරන්න

4.තොප්පි වෙළෙන්දා නාට්‍යයේ වෙළෙන්දාගේ චරිත ලක්ෂණ මොනවාද?

5.තොප්පිවෙළෙන්දා නාට්‍යය තුළින් අපට ලබා දෙන ආදර්ශ මොනවාද?



සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

Answer

හොරණ අධ්‍යාපන කලාපය

1.වේදිකාවක් මත කිසියම් පිටපතකට අනුව රඟ දැක්වෙන , අසා සහ බලා රස විඳිය හැකි නිර්මාණයකි.

2.සෝමලතා සුබසිංහ මහත්මිය

3. කතන්දර දෙකක්/ විකෘති/ පුංචි අපට දැන් තේරෙයි/ වලස් පවුල/හිම කුමරිය

4 . බුද්ධිමත් බව

උපාය ශීලී වීම

උත්සහවන්ත බව

5. තැනට සුදුසු නුවණ පාවිච්චි කිරීමේ වැදගත්කම

උපායශීලී වීම

Answer

Anuhas

හොරණ අධ්‍යාපන කලාපය

95%

(1) වේදිකාවක මත කිසියම් පිටපතකට අනුව රඟ දැක්වෙන, අසා බලා රස විඳිය හැකි නිර්මාණයකි.

(2) සෝමලතා සුබසිංහ මහත්මිය.

(3) කතන්දර දෙකක්
විකෘති
පුංචි අපට දැන් තේරෙයි.
රත්මලී
වලස් පවුල
හිම කුමරිය.

(4) අභ්‍යාවන්තයි.

කරුණාවන්ත අයෙකි

ළමයින් වෙනුවෙන් වෙහෙස මී වැඩ කරන පියෙකි.

(5) සිහිසුන් නුවණක්කාර බව

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda

## නාලන්දා විද්‍යාලය - කොළඹ 10

### ඒකක පරීක්ෂණය - 2020

### සිංහල භාෂාව

### 7 ශ්‍රේණිය

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**22 - ඒකකය**

## <u>තොප්පි වෙළෙන්දා</u>

(1) (i) ළමා නාට්‍ය යනුවෙන් අදහස් කරන්නේ කවරක් ද ?

…………………………………………………………………………………………..

(ii) 'තොප්පි වෙළෙන්දා ' ට අමතරව මෙම කතුවරිය විසින් රචනා කළ ළමා නාට්‍ය 05 ක් නම් කරන්න.

…………………………………………………………………………………………..

…………………………………………………………………………………………..

…………………………………………………………………………………………..

(iii) වඳුරන් තොප්පි වෙළෙන්දාගේ දුටු වෙනස්කම් මොනවාද ?

…………………………………………………………………………………………..

(iv) ' අමුතු වඳුරු රාළ කෙනෙක් ' මෙසේ කීවේ කවුද ?

…………………………………………………………………………………………..

(v) මෙම නාට්‍යයේ ඇති නාට්‍යෝචිත අවස්ථා දෙකක් උපුටා ලියන්න.

…………………………………………………………………………………………..

(2) (i) රංග විධාන යනු මොනවා ද?

…………………………………………………………………………………………..

(ii) නාට්‍යෝචිත අවස්ථා යනු මොනවා ද ?

…………………………………………………………………………………………..

(iii) නාට්‍ය පෙළ වශයෙන් හඳුන්වන්නේ කුමක් ද ?

…………………………………………………………………………………………..

(iv) නාට්‍යයේ දෙබස් සඳහා යොදා ගන්නා ක්‍රම තුන නම් කරන්න.

…………………………………………………………………………………………..

Anuhas

නාලන්දා විදුහල
22 ඒකකය

78%

**Answer**

① (i) ළමයින්ගේ පෞරුෂ වර්ධනයට, බුද්ධි වර්ධනයට මෙන් ම, මානව දායාමෙන් හෙබි පුරවැසියකු වීමට අවශ්‍ය පදනම සකස් කිරීමට ද දායක ප්‍රබල මාධ්‍යයකි.

ළමයින් සඳහා ම ළමයින්ට ගැළපෙන තේමාවක් පාදක කර ගෙන ළමයින්ට ගැළපෙන ආකාරයට සැකසුණු නාට්‍ය, ළමා නාට්‍ය ලෙස හැඳින්වේ.

(ii) විකාටකී
කතන්දර 2ක්
පූංචි අපිට දැන් තේරෙයි
රත්මල්
හිම කුමරිය.

(iii) වලිග නැත.
බිවිල් නැත.
කරනම් ගැසීමට නොහැක.
ගසින් ගසට පැනීමට නොහැක.

(iv) 1 වඳුරා

වඳුරන්

(v) නොප්පි වෙළෙන්දා ඈ නිදා සිටි වෙලාවේ කඩා පැන්නේ

නොප්පි වෙළෙන්දා අහැරෙන විට හිස් කූඩය දැකීම.

② (i) නළු නිළියන්ගේ ප්‍රයෝජන සඳහා රංග විධාන දක්වයි

(iii) නාට්‍යය සඳහා ඇති පිටපත නාට්‍ය පෙළ වේ.

(ii) ප්‍රේක්ෂක සිදුවන්නේ කුමක්දැයි යන කුතුහල සිරි අවස්ථා නාට්‍යෝචිත අවස්ථා නම් වේ

(iv) දෙබස්
නාට්‍ය පෙළ ගද්‍ය
රංග විධාන පද්‍ය
ගද්‍ය පද්‍ය මිශ්‍රණ

# මීගමුව අධ්‍යාපන කලාපය

## ඒකක පුනරීක්ෂණ කාර්ය පත්‍රිකා

විෂයය : සිංහල ශ්‍රේණිය : 07

## තොප්පි වෙළෙන්දා

1. එම ජන කතාව කෙටියෙන් ලියන්න.
2. නාට්‍ය පිටපත හොඳින් කියවා රසවිඳින්න.
3. මෙම නාට්‍ය පිටපත රචනා කර ඇත්තේ කවුද ?
4. ඇයගේ වෙනත් නාට්‍ය නිර්මාණ කිහිපයක් නම් කරන්න.
5. එම නාට්‍යයේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.
6. 179 වන හා 180 පිටවී අභ්‍යාසයන්හි නිරත වන්න.
7. ඔබ දන්නා කුඩා ජන ජනකතාවක් ඇසුරෙන් කුඩා නාට්‍ය පිටපතක් රචනා කරන්න .

සැකසුම
ටජ්මා ජයසේකර
ලංකාසභා ක.ද්වි.විද්‍යාලය



Anuhas

මීගමුව අධ්‍යාපන කලාපය .
22 ඒකකය

Answer

100%

① හදපු තොප්පි , තොප්පි වෙළෙන්දා විකුණයි. විකුණන විට මහන්සි දැනී ඔහු ගස ළඟ නිදා ගනී. වඳුරු රැළක් එම තොප්පි ගෙන ගස උඩට නගී. වෙළෙන්දා අවදි වන විට කුඩය හිස් ය. ඔහු වඳුරු රැළ මෙය රැගෙන බව දුටුවේය. ඔහු කරන දේ වඳුරන් කරන බව දැන ගත්තේය. ඔහු තොප්පියක් ගෙන කුඩයට විසි කළේ ය. ඉන්පසු අපසු තොප්පි ටික ඔහු ගත්තේ ය .

②

③ සෝමලතා සුබසිංහ .

④ රත්මලි
මලක් හූල
හිමු කුමරිය .
පුංචි අපට දැන් තේරෙය



6

# යාත්‍රිකයා සහ මුහුද

(මුහුදේ ඇතිවූ කුණාටුවක් නිසා නැව විනාශ විය.)

මිනිසා - හ්... හ්...
අපූම මහන්සියි

(මිනිසා නින්දට වැටුණි. උදේ විය.)

මිනිසා - ඔබ බොරුකාරයෙක්!.
ඇතින් ඉන්නකොට හොඳට ඉන්නවා.
ළඟින් ඉන්නකොට නපුරු වෙනවා

මුහුදු දේවිය - මට බනින්න එපා. වැරැද්ද මගේ
නොවෙයි. වැරැද්ද සුළඟගේ. මම
සන්සුන් කෙනෙකි.

සුළඟ මට පහර දෙනවා, එවිට
මම නපුරු වෙනවා.

ආදර්ශය - වෙනත් පුද්ගලයින් මගින් පාලනය
වන අයගෙන ප්‍රවේසම් වන්න.



හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

ඉගෙනුම් උපකාරක...

## නාට්‍යය යනු

වේදිකාවක් මත කිසියම් පිටපතකට අනුව රඟ දැක්වෙන ඇසීමෙන් හා බැලීමෙන් රස විඳිය හැකි නිර්මාණයකි.

ළමයින් සඳහාම ළමයින්ට ගැළපෙන තේමාවක් පාදක කර ගෙන ළමයින්ට ගැළපෙන ආකාරයට සැකසුණු නාට්‍ය ළමා නාට්‍ය ලෙස හැඳින්වේ.

# තොප්පි වෙළන්දා ළමා නාට්‍යය

සෝමලතා සුබසිංහයන්ගේ නිර්මාණයකි.

තොප්පි වෙළෙන්දා නම් ප්‍රකට ජන කතාව පදනම් වී ඇත.

එම කතාවේ රසවත් සිදුවීම් ඇසුරෙන් නාට්‍යමය අවස්ථා නිර්මාණය කර ඇත.

# සෝමලතා සුබසිංහ මහත්මිය




- සුප්‍රසිද්ධ නාට්‍ය කලාවේදිනියකි.
- 1936 ජූලි 02 වන දින ගම්පහ දී උපත ලැබිය.
- ළමයින් සඳහා නාට්‍ය රැසක් නිර්මාණය කර ඇති අතර ළමා නාට්‍ය කලාව වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කර ඇත.
- කලා සූරි හා කලා කලා කීර්ති සම්මානවලින් පිදුම් ලබා ඇත.
- 2015 මැයි 30 දින මෙලොවින් සමුගත්තා ය.

# සෝමලතා සුබසිංහ මහත්මියගේ වෙනත් ළමා නාට්‍ය නිර්මාණ

කතන්දර දෙකක් (1979)

විකෘති (1992)

පුංචි අපට දැන් තේරෙයි (1998)

රත්මලි (2000)

වලස් පවුල

හිම කුමරිය (2000)

# තොප්පි වෙළෙන්දා නාට්‍ය සාරාංශය

- තොප්පි වෙළෙන්දා තොප්පි කූඩයක් හිසේ තබාගෙන ගමින් ගමට ඇවිදිමින් තොප්පි වෙළඳාමේ යෙදේ.
- විඩාවට පත් වෙළෙන්දා තොප්පි කූඩය පසෙක තබා ගසක් යට ගිමන් හරිමින් සිටින අතරතුර ඔහු නින්දට වැටෙයි.
- ගස උඩ සිටි වඳුරු රංචුවක් වෙළෙන්දා සහ තොප්පි කූඩය දැක ගස යටට පැමිණ, තොප්පි හිසෙහි පැළඳ නටමින් සිනාටසමින් ප්‍රීති වෙති.
- නින්දෙන් අවදිවන වෙළෙන්දා වඳුරන්ගේ මෙම ක්‍රියාව දැක විමතියටත් කෝපයටත් පත්වේ.
- වඳුරන් තමන් අනුකරණය කරන බව වටහා ගත් වෙළෙන්දා උපායකින් වඳුරන් රවටා තොප්පි ටික නැවත ලබා ගෙන එතැනින් පිටව යයි.







# තොප්පි වෙළෙන්දා නාට්‍යයෙන් ලබා ගතහැකි ආදර්ශ

- තැනට සුදුසු නුවණ පාවිච්චි කිරීමේ වැදගත්කම

- කිසියම් දෙයක් පිළිබඳව අවබෝධයකින් තොරව අනුකරණය කිරීමට යාමෙන් අයහපතක් සිදුවිය හැකි බව

- උපායශීලී වීමේ වැදගත්කම

# ළමා නාට්‍ය පිටපත් රචනය

## ළමා නාට්‍යයක් තුළින්

- ළමයින්ගේ පෞරුෂ වර්ධනය
- බුද්ධි වර්ධනය
- මානව දයාවෙන් හෙබි පුරවැසියෙකු වීමට අවශ්‍ය පදනම සකස් කිරීම අපේක්ෂා කෙරේ.

නාට්‍යයක් නිර්මාණයේදී ප්‍රධාන වශයෙන් ම නාට්‍ය පිටපතක් (නාට්‍ය පෙළ) තිබිය යුතුය.

නාට්‍ය පෙළ

ගද්‍ය විය හැකිය

පද්‍ය විය හැකිය

ගද්‍ය පද්‍ය දෙකෙහිම මිශ්‍රණයක් විය හැකිය.

කතාවක් තෝරා ගෙන දෙබස් මගින් දැක්වීමෙන් නාට්‍ය පිටපත නැතහොත් නාට්‍ය පෙළ රචනා කෙරේ

# රංග විධාන

නළු නිළියන්ට රංගනයේදී අවශ්‍ය වන උපදෙස් මෙලෙස හැඳින්වේ.

සංවාද යටින් වරහන් තුළ රංග විධාන සටහන් කර ඇත.

උදාහරණ :- කරනමක් ගසා

තොප්පියක් අතට ගෙන පරීක්ෂා කරමින්

කූඩය හිසෙන් බිමට බා

දුව එමින්

ප්‍රෞරාගත් කතාවක් ඇසුරෙන් නාට්‍යයට උචිත අවස්ථා තෝරා ගනිමින් නාට්‍ය පිටපතක් රචනා කිරීමේ හැකියාව ඔබටත් ඇත.

එහිදී නාට්‍යයේ රසවත් බව මෙන්ම ජීවිතයට වැදගත් වන කිසියම් උපදේශයක් ඇතුළත් කිරීම ද වැදගත් වේ.

# අභ්‍යාස

1.නාට්‍යයක් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?

2.තොප්පි වෙළෙන්දා නාට්‍යය නිර්මාණය කර ඇත්තේ කවුරුන්ද?

3.සෝමලතා සුබසිංහ මහත්මියගේ වෙනත් ළමා නාට්‍ය නිර්මාණ කිහිපයක් නම් කරන්න

4.තොප්පි වෙළෙන්දා නාට්‍යයේ වෙළෙන්දාගේ චරිත ලක්ෂණ මොනවාද?

5.තොප්පිවෙළෙන්දා නාට්‍යය තුළින් අපට ලබා දෙන ආදර්ශ මොනවාද?